ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2148/51 - 2019 නොවැම්බර් මස 08 වැනි සිකුරාදා - 2019.11.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2129/95 සහ 2019.06.28 දාතම දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ වැරදි නිවැරදි කිරීමේ දැන්වීමයි*

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අංක 2129/95 සහ 2019.06.28 දාතම දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 07 - 4554/10 දරන ගැසට් නිවේදනය මෙයින් නිවැරදි කරමි.

එකී අති විශෙෂ ගැසට් නිවේදනයේ ඉහළ කොටසේ ශීර්ෂයේ "පොළොන්නරුව මහ නගර සහා බල ප්‍රදේශයෙන්" වෙනුවට "**පොළොන්නරුව මහ නගර සභාව සහ පොළොන්නරුව ප්‍රාදේශීය සභාව (කොටසක්) යන බල ප්‍රදේශයන්ගෙන්**" ලෙස යෙදීමෙන් ද, ඉහත කී *අති විශෙෂ ගැසට්* නිවේදනයේ ඉහළ කොටසෙහි අන්තර්ගතයෙහි 1 වැනි පේළියේ "1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත හා එහි සංශෝධන පනත් හි" වෙනුවට "**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ**" ලෙස ඇතුළත් කිරීමෙන් ද, 2 වැනි පේළියේ "පොළොන්නරුව මහ නගර සහා බල ප්‍රදේශයෙන්" වෙනුවට "**පොළොන්නරුව මහ නගර සභාව සහ පොළොන්නරුව ප්‍රාදේශීය සභාව (කොටසක්) යන බල ප්‍රදේශයන්ගෙන්**" ලෙස ඇතුළත් කිරීමෙන් ද, 2 වැනි පේළියේ "සංවර්ධන බල ප්‍රදේශය" වෙනුවට "**සංවර්ධන ප්‍රදේශය**" ලෙස ඇතුළත් කිරීමෙන් ද, 3 වැනි පේළියේ "පොළොන්නරුව නාගරික" ඉවත් කිරීමෙන් ද, පහත පරිදි නිවැරදි විය යුතුය.

***"පොළොන්නරු මහ නගර සභාව සහ පොළොන්නරුව ප්‍රාදේශීය සභාව (කොටසක්) යන බල ප්‍රදේශයන්ගෙන් සමන්විත වන පොළොන්නරුව නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි. "***

"1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව පොළොන්නරුව මහ නගර සභාව සහ පොළොන්නරුව ප්‍රාදේශීය සභාව (කොටසක්) යන බල ප්‍රදේශයන්ගෙන් සමන්විත පොළොන්නරුව නාගරික සංවර්ධනය ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මා විසින්, එකී පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතලවලට අනුකූලව 2019 ජූනි මස 28 වැනි දින අනුමත කරන ලද බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි."

**පාඨලී චම්පික රණවක,**
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 නොවැම්බර් මස 07 වැනි දින,
17 හා 18 වන මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

1A - G 31433 - 19 (2019/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එකී *අති විශෙෂ ගැසට් නිවේදනයේ* පහළ කොටසේ ශීර්ෂයේ "සභා බල ප්‍රදේශ" වෙනුවට **"සභාව සහ පොළොන්නරුව ප්‍රාදේශීය සභාව (කොටසක්)" යන බල ප්‍රදේශයන්ගෙන් සමන්විත වන පොළොන්නරුව නාගරික සංවර්ධන ප්‍රදේශය"** යෙදීමෙන් ද, ඉහත කී *අති විශෙෂ ගැසට් නිවේදනයේ* පහළ කොටසේ අන්තර්ගතයෙහි "1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "අ" වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද පොළොන්නරුව මහ නගර සභා බල ප්‍රදේශ වෙනුවට, **1982 අංක 4 දරන පනතෙන් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8"අ" වගන්තියේ බලතල ප්‍රකාර පොළොන්නරුව මහ නගර සභාව සහ පොළොන්නරුව ප්‍රාදේශීය සභාව (කොටසක්) යන බල ප්‍රදේශයන්ගෙන් සමන්විත පොළොන්නරුව නාගරික සංවර්ධන ප්‍රදේශය"** ඇතුළත් කිරීමෙන් ද, පහත පරිදි නිවැරදි විය යුතුය.

***"පොළොන්නරුව මහ නගර සභාව සහ පොළොන්නරුව ප්‍රාදේශීය සභාව (කොටසක්) යන බල ප්‍රදේශයන්ගෙන් සමන්විතවන පොළොන්නරුව නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම"***

"1982 අංක 4 දරන පනතෙන් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8"අ" වගන්තියේ බලතල ප්‍රකාර පොළොන්නරුව මහ නගර සභාව සහ පොළොන්නරුව ප්‍රාදේශීය සභාව (කොටසක්) යන බල ප්‍රදේශයන්ගෙන් සමන්විත පොළොන්නරුව නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8"ඊ" වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019 ජුනි මස 28 වැනි දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි."

**ආචාර්ය ජගත් මුණසිංහ,**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2019 නොවැම්බර් මස 07 වැනි දින,

අංක 2129/95 සහ 2019.06.28 දාතම දරන *ගැසට් පත්‍රයේ* 07 - 4554/10 දරන පූර්වගාමී ගැසට් නිවේදනයෙහි ප්‍රතිපාදනයන්හි කෙසේ සඳහන් වුව ද, මෙහි ඉහත සඳහන් වරද නිවැරදි කිරීම අතීතයට බලපාන පරිදි බල පැවැත්විය යුතු අතර, 2019 ජුනි මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතුය.

**පාඨලී චම්පික රණවක,**
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 නොවැම්බර් මස 07 වැනි දින,
17 හා 18 වන මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

11 - 1483

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.